Nestlé
Good Food, Good Life

Nestlé Lanka PLC News Release
Colombo: 13 January 2017

# නෙස්ලේ ලංකා සමාගම කිරි සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීම වෙනුවෙන් නවතම ආයෝජනයකට මුලපුරයි

වර්ෂ ගණනාවක් පුරාවට ශ්‍රී ලංකාව තුළ සිදුකළ ආයෝජන ඉදිරියට ගෙනයමින්, නෙස්ලේ ලංකා සමාගම සිය ගමන් මගෙහි තවත් වැදගත් ඉදිරි පියවරක් ලෙස කුරුණෑගල, පන්නල නෙස්ලේ කර්මාන්තශාලා භූමිය තුළම නව ආයෝජනයක් ඉදිකිරීම වෙනුවෙන් මුල්ගල් තැබීමට කටයුතු කලේය. මෙය දේශීය කිරි සහ පොල් කර්මාන්තයන්හි සංවර්ධනය වෙනුවෙන් නෙස්ලේ ලංකා සමාගම ලබා දෙන විශිෂ්ට කැපවීම පෙන්නුම් කර දුන් තවත් වැදගත් අවස්ථාවකි.

නෙස්ලේ කුරුණෑගල කර්මාන්තශාලාවෙහි ඉදිකෙරුනු මෙම නවතම ආයෝජනය සඳහා මුල් ගල තැබීමේ උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් සහභාගී විය.

තිරසාර සංවර්ධන සහ වනජීවී අමාත්‍ය, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා; ආපදා කළමනාකරණ අමාත්‍ය, ගරු අනුර ප්‍රියදර්ශන යාපා ; මුදල් අමාත්‍ය, ගරු රවී කරුණානායක; ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍ය, ගරු පී. හැරිසන් සහ ශ්‍රී ලංකාවේ සහ මාලදිවයින් රාජ්‍යයේ ස්විට්සර්ලන්ත තානාපති, අතිගරු හෙයින්ස් වෝකර් නෙඩකුන් මැතිතුමන් ද විශේෂ ආරාධිතයින් ලෙස මෙම අවස්ථාවට සහභාගී වීය.

නෙස්ලේ ලංකා සමාගම සිය නවතම ආයෝජනය හරහා සැලසුම් කරනුයේ සිය කිරි සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන වල ධාරිතාවය ඉහළ නැංවීමටයි. ඒ හරහා දේශීය පාරිභෝගිකයින්ට ඔවුන්ට හුරු රසයෙන් සහ පෝෂණ අවශ්‍යතාවයන්ගෙන් පරිපූර්ණ නිෂ්පාදන වැඩි වශයෙන් සැපයීමට සමාගමට හැකියාව ලැබෙනු ඇත.

නෙස්ලේ සමාගම ශ්‍රී ලංකාව තුළ සිය ව්‍යාපාර මෙහෙයුම් අරඹා වර්ෂ 110කට අධික වන අතර, දේශීය බහුජාතික සමාගමක් වශයෙන් දේශීය අමුද්‍රව්‍ය වැඩි වශයෙන් යොදාගනිමින් සිය නිෂ්පාදන සිදුකරන සාඩම්බර ව්‍යාපාරික ආයතනයක් ලෙස හැඳින්විය හැක. දැනට රට තුල අලෙවි වන නෙස්ලේ නිෂ්පාදන වලින් 90%කට වඩා ගණනක් එහි කර්මාන්තශාලාව තුල නිපදවන අතර එම නිෂ්පාදන, රටවල් 50 කට අධික ප්‍රමාණයකට අපනයනය කෙරේ. එය ආනයන ආදේශන සහ අපනයන පුළුල් කිරීමටද දායක වෙයි.

නෙස්ලේ සමාගමේ නව ආයෝජනයට සුභ පැතු ගරු රවී කරුණානායක මැතිතුමා, වර්ෂ 110කට අධික වන සමාගමේ සේවය පැසසීමට ලක් කල අතර, ඒ මගින් දේශීය කිරි ගොවීන් දිරිමත් කරමින් රට තුල ආනයන ආදේශන ඇති කරමින්, ශක්තිමත් දේශීය ආර්ථිකයක් බිහි කිරීමට සමාගම දැරූ දායකත්වය ගැන ප්‍රශංසා කලේය.

නෙස්ලේ ලංකා සමාගමේ නවතම ආයෝජනය පිළිබඳව අදහස් දක්වමින් එහි කළමනාකාර අධ්‍යක්ෂිකා ශිවානි හෙග්ඩේ මහත්මිය මෙසේ පැවසුවාය. ''ශ්‍රී ලංකාවේ සංවර්ධනය වෙනුවෙන් ව්‍යාපාරික ආයතනයක් වශයෙන් අපි කැපවීමෙන් කටයුතු කරනවා. රටේ ඉදිරි ගමන පිළිබඳව රජය සතු දැක්ම යථාර්තයක් කරගැනීම වෙනුවෙන් අපි අපගේ ආයෝජනයන් සිදුකරනවා. අප සිදු කරනු ලබන මෙම නවතම ආයෝජනය නිසා ශ්‍රී ලාංකික ජනයාට

ගුණාත්මක ජීවන තත්ත්වයක් ලබා දීමේ අපේ අරමුණට තවත් වටිනාකමක් ලැබෙනවා. එපමණක් නොවෙයි අප සමග කටයුතු කරන ගොවි ජනයාගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමද සිදුවෙනවා.''

මුල්ගල තැබීමේ අවස්ථාවට සමගාමීව නෙස්ලේ ලංකා සමාගම සමග කටයුතු කරන කිරි සහ පොල් ගොවීන්ගේ කැපවීම ඇගයීමට, ගොවි උපහාර වැඩසටහනක්ද සංවිධානය කර තිබුණි. මේ අවස්ථාවට 200කට අධික ගොවීන් පිරිසක් සහභාගී විය.

''මම 2010 වසරේදී මගේ ව්‍යාපාරය ආරම්භ කලේ කිරි ලීටර් 5 කින්. මගේ අස්වැන්න වැඩි කිරීමට ගොවි පුහුණුව සඳහා නෙස්ලේ සමාගමෙන් ලැබුණු අඛණ්ඩ සහයෝගය නිසා දවසට කිරි ලීටර් 100 ක් දක්වා මගේ ව්‍යාපාරය දියුණු වී ඇත. අප ගොවි ජනතාවට වැඩි කිරි අලෙවි කිරීමට සහ විශාල ආදායමක් ලබාදීමට නව අවස්ථාවක් ලබා දීම වෙනුවෙන් මම නෙස්ලේ සමාගමට ස්තුතිවන්ත වෙනවා.'' යනුවෙන් මුලතිව් හි නෙස්ලේ කිරි ගොවියෙකු වන කේ. මතනකුමාරි මහත්මිය අදහස් දක්වමින් කියා සිටියා.

විශේෂයෙන්ම කිරි සහ පොල් කර්මාන්තයේ දියුණුව වෙනුවෙන් සහයෝගය ලබා දෙමින් නෙස්ලේ ලංකා සමාගම ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය නගාසිටුවීම වෙනුවෙන් සැලකිය යුතු ආයෝජනයන් ප්‍රමාණයක් සිදු කර තිබේ. වාණිජමය වශයෙන් ලබාගත හැකි රටේ නැවුම් කිරි ප්‍රමාණයෙන් තුනෙන් එකක් මිල දී ගන්නා, ශ්‍රී ලංකාවේ පෞද්ගලික ව්‍යාපාර අංශයේ විශාලතම නැවුම් කිරි මිලදී ගන්නා ලෙස හා ලොව විශාලතම පිටි කළ පොල් කිරි අපනයන සමාගම් අතරින් එකක් ලෙස නෙස්ලේ ලංකා සමාගම ආසන්න වශයෙන් දේශීය ගොවීන් 27,000කට සහ ඔවුන්ගේ පවුල්වල ජීවනෝපාය වෙනුවෙන් විශාල සහයෝගයක් ලබා දෙයි. 2016 වර්ෂයේදී සිය නිෂ්පාදන සඳහා යොදාගන්නා මෙම අමුද්‍රව්‍ය මිලදී ගැනීමට නෙස්ලේ ලංකා සමාගම දේශීය ගොවීන් වෙනුවෙන් වැය කර ඇති මුදල රුපියල් බිලියන 6 කි. මෑතකදී නෙස්ලේ සමාගම විසින් පොල් වගා කිරීමේ මණ්ඩලය සමග එක්ව පොල් සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. එහිදී අක්කර 150 ක භූමි ප්‍රදේශයක් පුරා පොල් වගාවේ නිරත පවුල් 2,000 ක් වෙනුවෙන් පොල් පැළ 10,000 ක් ප්‍රදානය කරන ලද අතර පොල් වගාවේ නිසි ක්‍රමවේද සහ උසස් ප්‍රමිතිය සඳහා ආදර්ශයක් සැපයීමේ අරමුණින් ආදර්ශ ගොවිපොළ දෙකක්ද ඉදි කරන ලදී.

නෙස්ලේ ලංකා සමාගම, දේශීය ප්‍රජාවේ සවිමත් සමාජිකයෙක් ලෙස ග්‍රාමීය ආර්ථිකයේ සංවර්ධනයට සහයෝගය ලබා දෙමින්, දේශීය හැකියාවන් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ආයෝජනයන් සිදුකරමින්, නව නිෂ්පාදන තාක්ෂණයන් හඳුන්වාදීමට කටයුතු කරයි. තවද නෙස්ලේ සමාගමේ කීර්තිමත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව උසස් තත්ත්වයේ දේශීය නිෂ්පාදන සහ සේවාවන් දේශීය පාරිභෝගිකයින්ට ලබා දෙමින් ශ්‍රී ලාංකික ජනතාවට පෝෂණය, සෞඛ්‍ය සහ යහගුණය රැගෙන ඒමට නෙස්ලේ ලංකා සමාගම සිය කැපවීම ලබා දී ඇත.